ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සහ කිවුල් ඔය ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය

ඉංජිනේරු සැලසුම් හා ක්‍රමසම්පාදන සේවා ඒකකය (සැලසුම් කණ්ඩායම - කොළඹ)

(මාදුරු ඔය ව්‍යාපෘති කාලසීමාව 2026–2032, කිවුල් ඔය ජලාශ ව්‍යාපෘති කාලසීමාව 2026–2031)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 02/2026 දරන වක්‍රලේඛයට සහ අදාළ රාජ්‍ය බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුකූලව, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සහ කිවුල් ඔය ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පූර්ණ කාලීන කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සුදුසුකම්ලත්, කැපවීමෙන් කටයුතු කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2026.03.28 දිනැති MSD අංක 02/2026 දරන වක්‍රලේඛයේ I වන ඇමුණුමේ 02 වන තීරුවේ මූලික සුදුසුකම් සහ පළපුරුදු අවශ්‍යතා දක්වා ඇති අතර, II වන ඇමුණුමේ 02 වන තීරුවේ ඒ ඒ තනතුරට අදාළ වන වැටුප් දක්වා ඇත.

සහායක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය, අංක 02/2026 දරන MSD වක්‍රලේඛය සහ වෙනත් අදාළ රාජ්‍ය බඳවා ගැනීමේ පටිපාටීන් අදාළ වේ.

ඇබෑර්තු පිළිබඳ විස්තර

අංකය	විස්තරය / සේවා ස්ථානය	වැටුප් මට්ටම	තනතුරු ගණන
1	ඉංජිනේරු සැලසුම් හා ක්‍රමසම්පාදන සේවා ඒකකය – (සැලසුම් කණ්ඩායම), කොළඹ	• MSD වක්‍රලේඛ අංක 02/2026 • සහායක කාර්ය මණ්ඩලය සඳහා අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	10

පොදු කොන්දේසි

✓ අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, රජයේ රීති හා රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය අවශ්‍යතා වේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල පූර්ව පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

✓ දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් යොමු කළ යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා:

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ (MASL) නිල වෙබ් අඩවියට පිවිසෙන්න – https://mahaweli.gov.lk
- දුරකථන අංක : 0112 695972 / 0112 689743

(ඉහත සඳහන් කළ චක්‍රලේඛය ලබා ගැනීම සඳහා කරුණාකර මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවිය බලන්න)

✓ අයදුම්පත් 2026.11.30 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
නො. 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

කෙටි ලැයිස්තුවකට ඇතුළත් කළ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. කුමන හෝ ආකාරයකින් බලපෑම් කිරීම් නුසුදුසු වීමට හේතු වන අතර, එවැනි ක්‍රියාවන්හි නිරත වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය